සැ. යු. — මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

2012.03.02 දින පළ වූ අංක 1,748 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,749 - 2012 මාර්තු මස 09 වැනි සිකුරාදා - 2012.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 652 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 652 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |



සැ. යු. - චන්ද්‍රිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සෙය්යිද් ෂේත් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 16 වැනි දින පළ කරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2012 මාර්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මඩකලපුව මහ නගර සභාවේ පළාත් පාලන බලප්‍රදේශයට අයත් පොදු ගෝ ඝාතකාගාරය, මස්කඩ ආඥා පනතේ (272 අධිකාරය) 26 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධියට පත් කිරීම හා ප්‍රකාශයට පත්කිරීම**

මස්කඩ ආඥාපනතේ (272 අධිකාරය) 26 වැනි වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේසහතික කිරීම මත, නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍ය සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් වන මම, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඩකලපුව මහ නගර සභා බලප්‍රදේශයට අයත් මන්මුණේ උතුර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කොට්ඨාශ අංක 23 කුලත්තුකුඩා, සතුරුකොන්ඩාන් ප්‍රදේශයේ ඉදිකර ඇති ගොඩනැගිල්ල පොදු ගෝ ඝාතකාගාරයක් ලෙස මෙයින් ප්‍රසිද්ධියට පත්කර, ප්‍රකාශයට පත්කර, විධානය කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන
විෂය භාර අමාත්‍ය,
නැගෙනහිර පළාත් සභාව.

දෙදහස් දොළහ ජනවාරි මස 09 වැනි දින.
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව.
වරෝදයානගර්,
ත්‍රිකුණාමලය.

03-315

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2011 (2012)**

1.0 2009 සැප්තැම්බර් මස 02 දින සිට ක්‍රියාත්මකවන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2010.11.30 දින අනුමත කරන ලද සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය රත්නපුර නගරය තුළ පමණක් පැවැත්වේ.

2.0 මෙම විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධානයන් අනුව සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 දැනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් වන අතර ඉදිරියේදී ඇතිවන පුරප්පාඩුද මෙම විභාගයෙන් සම්පූර්ණ කරනු ලැබේ. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප : අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට අදාල වැටුප් කාණ්ඩය MN3-2006-A වන අතර මාසික වැටුප් පරිමාණය රු. 15,005- 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.0 සුදුසුකම් :- සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාල වේ:–

(අ) සබරගමුව පළාත් බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකා පුරවැසියකු වීම : අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්ව වසර 03 ක් අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය;

සහ

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය ; සහ

(ඇ) (i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා 3 න් එකකට අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් තිබීම; සහ

(ii) ගණිතය හා වෙනත් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම. (මින් විෂයයන් 5 ක් එකවර සමත්ව තිබීම.) ; සහ

(iii) අ.පො.ස, (උ. පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් 3 කින් සමත්ව තිබීම.

සහ

(ඈ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම; හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

සටහන :

(i) සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2012 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(ii) සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට අවස්ථා තුනකට වඩා පෙනී සිටීමට කිසිවකුට අවසර නොමැත.

7.0 විභාග පරිපාටිය :

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | පුස්තකාල විද්‍යාව | 100 යි | පැය 03 යි |
| (ii) | බුද්ධි පරීක්ෂණය | 100 යි | පැය 01 යි |
| (iii) | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |

ඉහත විෂයන්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ:–

7.1 පුස්තකාල විද්‍යාව

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන හා නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල;
(ආ) ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකශනය;
(ඇ) මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම්
(ඈ) පුස්තකාල වර්ග

(i) විශේෂ පුස්තකාල
රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්.
(ii) ශාස්ත්‍රීය පුස්තකාල
විශ්ව විද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්
(iii) පාසල් පුස්තකාල
(iv) මහජන පුස්තකාල
(v) පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ආගමික ආයතන පුස්තකාල

(ඉ) පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතාවය, වැදගත්කම හා කාර්ය භාරය
(ඊ) පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්ය භාරය, ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රීලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍යය)
(උ) පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු

* පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩිදියුණු කිරීම

(ඌ) පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)
(ඒ) ආපදා (Disasters) සහ ආපදා කළමනාකරණය (Disaster Management)

2. දැනුම හා තොරතුරු සංවිධානය

(අ) ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන
(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිතා වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය
(ඇ) පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය (AACR) සම්ප්‍රදාය
(ඈ) ග්‍රන්ථ විස්තරය
(ඉ) AACR 2 සංස්කරණය භාවිතා කරමින් සංලේඛ සම්පාදනය

3. පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා

(අ) විවිධ පුස්තකාල සම්පත්
(ආ) එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම
(ඇ) පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
(i) පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර
(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා
(iii) තොග සමීක්ෂණය හා අපහරණ ක්‍රියාවලිය

(ඈ) ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම හා වාරණය
(ඉ) ප්‍රවර්තන සංජානන සේවය (Current Awareness Service)
(ඊ) පාඨක අධ්‍යාපන වැඩසටහන්
(උ) මහජන සම්බන්ධතා හා පුස්තකාල ප්‍රචාරණය

4. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)

(අ) පුස්තකාලවල පරිඝණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන්වල දී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායීතාවය

ඉහත ක්ෂේත්‍ර 4 ආවරණය වන සේ සකස් කෙරෙන ව්‍යුහගත රචනා/රචනා ශෛලියේ අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

7.2. බුද්ධි පරීක්ෂණය :
පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

7.3. සාමාන්‍ය දැනුම :
ජාතික, කලාපීය සහ සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) බැගින් වත් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුවන අතර, විවෘත තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

8.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු, රු. 400 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාතේ පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට /දෙපාර්තමේන්තුවට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කෙරෙන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තු ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 2003.09.01 ට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ.

9.0 අයදුම්පත්‍ර :

ඒ 4 (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිලිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2011 (2012)" යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2012 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය:–

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

10.0 *විභාගයට පෙනී සිටීම* .- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදන පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායාපිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙනම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සඳහා අදාළ ප්‍රතිඵල සටහන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් යථා කාලයේ දී නිකුත් කරනු ඇත.

11.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය:–

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

13.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.0 මෙම විභාග නිවේදනය සිංහලට අමතරව දෙමළ භාෂාවෙන් පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පද මාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තවද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

2012 පෙබරවාරි මස 16 වැනි දින,
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2011 (2012)**

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2 දෙමළ -3 [ ]
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Perera, A.B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————.

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : රත්නපුර 1 [ ]
කෑගල්ල 2
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————. (කොටුව තුළ අදාළ අංකය ලියන්න)
3.3 පදිංචිව සිටින කාලසීමාව :————.
3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4.0 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 [ ]
පුරුෂ - 2
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.1 උපන් දිනය: වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

4.2 2012 අප්‍රේල් මස 20 වැනි දිනට වයස:

අවුරුදු :————. මාස :————. දින :————.

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවැනි වර)
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවන වර)

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.3 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.4 විභාග නිවේදනයේ 6.0 (ඇ) ඡේදය ප්‍රකාර මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති පුස්තකාල විද්‍යාව සම්බන්ධ තුන් අවුරුදු ඩිප්ලෝමාව පිළිබඳ විස්තර :

(i) විශ්ව විද්‍යාලය :————.
ආයතනය :————.

(ii) ඩිප්ලෝමාව :————.
(iii) වර්ෂය :————.

6.0 වෙනත් සුදුසුකම් :————.

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :————.

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපතේ අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

9.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය ද, ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කළ යුතු ය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ...................... දින සිට ................. තනතුරේ සේවය කරන .................... මහතා/ මහත්මිය/ මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිඳු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හෝ
බලය පවරනු ලබන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවිය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය.

03-287

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.